## දෙල්ගොඩ ප්‍රදේශවාසීන්ගේ

# අවධානය පිණිසයි.....

දෙල්ගොඩ සිදුවූ පුද්ගල ඝාතනයන්ට සම්බන්ධ සියළුම විමර්ශනයන් තවම අවසන් නැත. එකම අවස්ථාවේ පස් දෙනෙකු ඝාතනය විය. තවත් දැරියක් අමානුෂික වධහිංසාවන්ට පත් කරනු ලදුව තවමත් අසාධ්‍ය තත්ත්වයේ ප්‍රතිකාර ලබයි.

මෙම සිදුවීමට සම්බන්ධ සැකකරුවන් ලෙස පොලීසිය විසින් අල්ලාගත් අයගේ දේපල පමණක් නොව එම සැකකරුවන්ගේ ඥාතීන්ගේ දේපල පවා ප්‍රදේශවාසීන් විසින් විනාශකර දමා තිබේ. අවසානයේ සඟවා ඇති ආයුධ සෙවීමට යෑමේදි ඇතිවූ සිද්ධියක් මත පොලිසිය විසින් කරන ලද වෙඩි තැබීමකින් මෙම සිද්ධියට වගකිවයුතු යැයි කියවෙන සැකකරුවන් දෙදෙනෙකු මිය ගිය බවද වාර්තා විය.

පසුගිය දිනවල මේ සිද්ධිය සම්බන්ධ තොරතුරු ඉතා උණුසම් අයුරින් මාධ්‍යවල පළවිය. මෙම සිද්ධීන් සම්බන්ධව ප්‍රදේශවාසීන්ගේද යම් ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබිණ. නමුත් අද තත්ත්වය.......?

මෙම ඛේදවාචකය සම්බන්ධයෙන් ප්‍රදේශයේ ප්‍රාදේශීය දේශපාලනඥයන් තවත් එක් දේශපාලන පක්ෂයකට විරුද්ධව විරෝධතා ව්‍යාපාරයක් ගෙන යෑම ඇරුණු කොට මේ සිද්ධි ජාලයට එරෙහිව යුක්තිසහගත ප්‍රාදේශීය මහජනක්‍රියා කාරීත්වයක් දක්නට නොලැබුණි.

මෙම මහා ඛේදවාචකය සම්බන්ධව ප්‍රදේශවාසීන් ලෙස ඔබ විසින් කළ මැදිහත්වීම ප්‍රමාණවත්ද ?

**ඔබගේ අවධානය පිණිස ප්‍රශ්න කිහිපයක්....**

**1 මෙම සිද්ධියේ දී ඝාතනයට ලක්වූවන්ගේ විලාපය අසල්වාසීන්ට නොඇසුනේ ඇයි ?**

**2 අපරාධයට සම්බන්ධ සැකකරුවන්ගේ දේපල විනාශයට වගකිව යුත්තේ ගම්වාසීන්ද?**

**3 අපරාධයට සම්බන්ධ සැකකරුවන් ඝාතනය කිරීමට සම්බන්ධව ඇති කතාවට ඔබ එකගද?**

**4 පොලිස් වෙඩි පහරට ලක්වූයේ සිද්ධියට සම්බන්ධ පුද්ගලයන්ම බවට ඔබට විශ්වාසද?**

**5 එක් අපරාධයකට තවත් අපරාධයකින් පිළිතුරු දීම ශිෂ්ඨ මිනිසුන් පිළිගනීද?**

**6 මෙම සිදුවීම් සියල්ලට මීට වඩා සාධාරණත්වයක් ලබා දිය නොහැකි යැයි ඔබ සිතනවාද?**

**7 සිදුවීම් සියල්ලෙන් පසුව ඇති වූ දැඩි නිහඬතාවයට හේතුව කුමක්ද?**

**8 තවත් මෙවැනි ඛේදවාචකයන් සිදුනොවේ යැයි ඔබට විශ්වාසද ?**

දෙල්ගොඩ සිදුවූ මෙම මහා ඛේදවාචකය සම්බන්ධව අප රටේ නීතියත්, නීති රකින ආයතනයන් හි ක්‍රියාකාරීත්වයත්, සාමාන්‍ය මිනිසුන් නීතිය හා යුක්තිය සම්න්ධව දක්වන ආකල්පයන් පිළිබඳවත් ඉතා හොඳින් පැහැදිලි වේ.

අප, Right to Life මානව හිමිකම් සංගරාව මෙම සිදුවීම පිළිබඳව ඔබ ප්‍රදේශයේ සිදුකළ තොරතුරු සොයා ගැනීමෙන් පසුව මෙම සිද්ධි ජාලයේ ඇති බැරෑරුම්කම අවබෝධ කර ගනිමින් මෙම සිද්ධියේ විවිධ පැතිකඩයන් පිළිබඳව සංගරාවේ ප්‍රධාන ලිපි කිහිපයකින් පාඨක අවධානය යොමු කරන ලදී.

දෙල්ගොඩ ප්‍රදේශයේ සිහිබුද්ධිය ඇති ප්‍රදේශවාසීන්ගෙන් අප ඉල්ලා සිටින්නේ මෙම සිදුවීම් දෙස නැවතත් ආපසු හැරී බලන ලෙසත්, අපරාධයක් තවත් අපරාධයකින් වසා දැමීමට ඉඩ නොතබන ලෙසත්, මේ සම්බන්ධව හරවත් සංවාදයක් හා ක්‍රියාකාරීත්වයක් යුක්තියේ හා මනුෂ්‍යත්වයේ නාමයෙන් ආරම්භ කරන ලෙසත් ය.

මෙම සංගරාවේ විග්‍රහයන් සම්බන්ධව ගැටළු, යෝජනා, චෝදනා හෝ වෙන යම් අදහස් ඇත්නම් ඔබට අප සමඟ ඒ පිළිබදව සාකච්ඡා කළ හැක.

**අප ඔබගේ ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටිමු.**


**Right to Life මානව හිමිකම් මධ්‍යස්ථානය**

**අංක 555, කොළඹ පාර, කටුනායක.**

**දුරකථන අංකය: 031 - 4870308**